# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1586 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 15/10/2024
පැය 1900

**මාධ්‍ය නිවේදනය**

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් - මාතර පොලිස් වසම.**

2024.10.15 වන අද දින සවස් කාලයේදී මාතර පොලිස් වසමේ රුවන්වැල්ල ප්‍රදේශයේදී ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට නාඳුනන තුවක්කුකරුවෙකු විසින් වෙඩි තබා පලාගොස් ඇත. වෙඩි වැදීමෙන් තුවාල ලැබූ පුද්ගලයා එම ස්ථානයේදීම මියගොස් ඇති බවට මාතර පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වූ මාතර කොටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටියදී, මෝටර් රථයකින් පැමිණි තුවක්කුකරුවෙකු විසින් මෙම වෙඩි තැබීම සිදුකර ඇති බවත්, මේ සඳහා පිස්තෝල වර්ගයේ ගිනි අවියක් උපයෝගී කරගෙන ඇති බවටත් දැනට සිදුකරන ලද විමර්ශනය අනුව පොලිසිය සැක කරනු ලබයි. වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. මෘත ශරීරය සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**